# භාෂා වර්ගීකරණයේ කාර්යයාත්මක මූලධර්ම අනුව චීන භාෂාවෙහි අනින්ද්‍රිය භාෂා ලක්ෂණ

තෙරිපැහැ උපනන්ද හිමි

**Abstract**

Many languages have emerged in human history and they help sustain human civilization as a cultural legacy by facing of various social factors. Due to the complex nature of language studies namadays, more attention is paid to scientific studies. Classification of languages is also one of the cases of scientific studies.Different criteria were used for that. The study explores Non-Organic Language features of Chinese according to functional principles by discussing those facts.

In this research, it is expected to reveal the criteria of language classification,  the Non-Organic Language features according to functional principles, the special features of the Chinese language as a Non-Organic Language. Chinese language and Non-Organic Language features are selected as the research approach and research limitation. Finally, it aims to analyze Non-Organic Language features of the Chinese Language.

**Key-words:** Non-Organic Language features, Functional principles, Chinese language, language classification, Linguistics

ප්‍රමුඛ පදඃ අනින්ද්‍රිය භාෂා ලක්ෂණ, කාර්යයාත්මක මූලධර්ම, චීන භාෂාව, භාෂා වර්ගීකරණය, වාග්විද්‍යාව

## හැඳින්වීම

නූතන වාග්විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණය විග්‍රහාත්මක වාග්විද්‍යාව වුවත්, දහ අට, දහ නවය ශත වර්ෂවල දී වාග්විද්‍යාවේ පරමාර්ථය

වූයේ භාෂා ඉතිහාසය සෙවීම යි. භාෂාව විධිමත් ව හැදෑරීම ආරම්භ වූයේ එම ශත වර්ෂවල දී ම වූවකැයි නො සිතිය යුතු ය. ක්‍රිස්තු වර්ෂාරම්භය ආසන්න සියවස්වල දී ඉන්දියාව, ග්‍රීසිය, මිසරය යන රටවල විධිමත් භාෂා හැදෑරීම් ක්‍රම පැවති බවට සාක්ෂි හමු වී ඇත. ඒවා හුදෙක් ඒ ඒ රටවලට සීමා වූ සිද්ධාන්ත ලෙස පැවතියේ ය. ග්‍රීසියේ ලියන ලද ආදිම ව්‍යාකරණය වන ඩයිනෝසියස් ත්‍රැක්සය ඉන්දීයයන්ට නොලැබිණි. පාණිනීගේ අෂ්ටධ්‍යායී ග්‍රන්ථය ග්‍රීකයන්ට නො ලැබිණි. එම කතෘවරුන්ට භාෂාවක් ස්වතන්ත්‍රව පරීක්ෂා කිරීමේ ගෞරවය හිමි වේ. ඉන් පසුව ඒවා ආකෘති කොට ගෙන පසුකාලීන වෛයාකරණඥයෝ භාෂාවන්ට ව්‍යාකරණ සැපයී ය. වියරණය භාෂාව බැඳ තැබීමට උපාය මාර්ගයක් ලෙස සලකන්නට වූයෙන්, එම වියරණ පැරණි කෘති තරම් වැඩ දායක නො වීය. මෙසේ භාෂා ශාස්ත්‍ර හැදෑරීම් ක්‍රමය, මුලින් තිබූ ස්වතන්ත්‍ර බවින් ඉවත් ව විද්‍යාත්මක ස්වරූපයෙන් අභාවයට ගියේ ය.

1786 සර් විලියම් ජෝන්ස් විසින් ඉදිරිපත් කරන ලද, සංස්කෘතය සහ අපරදිග භාෂා අතර ''මූල භාෂා සංකල්පය" වාග්වේදීන්ගේ සැලකිල්ලට යොමු විය. මේ භාෂා අතර වචන, ප්‍රත්‍ය, ධාතු, ශබ්ද ප්‍රකෘති ආදි වශයෙන් සමානත්වයක් දුටු වාග්වේදීහු 'ඉන්දු යුරෝපීය භාෂා' නමින් භාෂා ගණයක් පිහිටුවා ගන්නා ලදි. ඒ ඇසුරෙන් එකී භාෂාවන්ගේ ඉතිහාසයත්, සමානතා පිළිබඳ තුලනයත් යන දෙකරුණට මුල් තැන දෙමින් නූතන වාග්විද්‍යා ක්‍රමය උද්ගත විය. ඒ අනුව නූතන වාග්විද්‍යා ක්‍රමයෙහි ආරම්භක ස්වරූපය ඓතිහාසික වාග්විද්‍යාවයි. වාග්විද්‍යාව දහ නව වැනි සියවස මුළුල්ලෙහි ම පැවැත්තේ ඓතිහාසික ස්වරූපයෙනි. ජිනීවානු වාග්වේදී ෆර්දිනැන් දො සොසුය්යොගේ cours de Linguistique Generale නම් කෘතිය ප්‍රකාශයට පත්වීම දක්වා ම මෙම ප්‍රවණතාව පැවැත්තේ ය. 1922 දී "වර්තමාන වාග්විද්‍යාවෙහි ප්‍රධාන අංග ලක්ෂණය ඓතිහාසික ස්වරූපයයි" යන Otto Jespersen නැමැති ප්‍රසිද්ධ වාග්වේදියාගේ ප්‍රකාශයෙන් ඒ බව තහවුරු වේ. ඒ අනුව විසිවන සියවසෙහි වාග්විද්‍යාවේ විග්‍රහාත්මක ක්‍රමය ආරම්භ වීම දක්වා ම භාෂාව හැදෑරීම සඳහා භාවිත කළේ ඓතිහාසික වාග්විද්‍යාවේ ඓතිහාසික හා තුලනාත්මක ක්‍රමය යි. භාෂා වර්ගීකරණය පිළිබඳ නව අදහස් ඉදිරිපත් කිරීම මගින් ඒ පිළිබඳ ශාස්ත්‍රීය සංවාදයන් සිදු වීම භාෂා අධ්‍යයනයන්හි සුවිශේෂ අවස්ථාවක් ලෙස හඳුනා ගත හැකි ය.

එම වර්ගීකරණයන්හි ස්වරූපයන් අධ්‍යයනය කරමින් කාර්යයාත්මක මූලධර්ම අනුව චීන භාෂාවෙහි අනින්ද්‍රිය භාෂා ලක්ෂණ විග්‍රහ කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරෙයි.

**සාහිත්‍ය විමර්ශනය**

වාග්විද්‍යාත්මක භාෂා අධ්‍යයනවල භාෂා වර්ගීකරණය සම්බන්ධයෙන් විද්‍යමාන සාධක ප්‍රමාණවත් තරම් දක්නා ලැබේ. ඒ අතරින් මෙම පර්යේෂණය සඳහා සිංහල සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් ලියවුණු ද්විතීයික මූලාශ්‍රයන් පරිශීලනය කෙරිණි. ඒවා ඇසුරින් භාෂා වර්ගීකරණයේ කාර්යයාත්මක මූලධර්ම අනුව අනින්ද්‍රිය භාෂා ලක්ෂණ විමර්ශනය කළ හැකි ය. අනතුරුව එම න්‍යායාත්මක කරුණු ඔස්සේ චීන භාෂාව අධ්‍යයනය සඳහා එම භාෂා මූලාශ්‍රයන් යොදා ගැණුනි. "භාෂා වර්ගීකරණයේ කාර්යයාත්මක මූලධර්ම අනුව චීන භාෂාවෙහි අනින්ද්‍රිය භාෂා ලක්ෂණ" වාග්විද්‍යාවේ න්‍යායාත්මක කරුණු ආශ්‍රයෙන්, චීන භාෂාවේ භාෂණාර්ථ ගවේෂණය කරමින්, ස්වාධීන අධ්‍යයනයක් ලෙස සිදු කෙරෙයි.

**පර්යේෂණ ගැටලුව**

භාෂා වර්ගීකරණයේ නිර්ණායක කවරේද, කාර්යයාත්මක මූලධර්ම අනුව අනින්ද්‍රිය භාෂා ලක්ෂණ කවරේද, අනින්ද්‍රිය භාෂාවක් ලෙස චීන භාෂාවෙහි විශේෂතා කවරේද යනාදිය පර්යේෂණයෙහි ගැටලුව යි.

**පර්යේෂණ අරමුණු**

චීන භාෂාවෙහි අනින්ද්‍රිය භාෂා ලක්ෂණ පිළිබඳ ව විමර්ශනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි.

**පර්යේෂණ වැදගත්කම**

වාග්විද්‍යාත්මක අධ්‍යයනයන් ඇසුරින් චීන භාෂාවෙහි ස්වභාවය අනාවරණය කිරීම චීන භාෂාව සම්බන්ධ ව නවක විද්‍යාතර්ථීන්ගේ උනන්දුව වැඩි දියුණු කිරීමට හේතු වේ. මෙම පර්යේෂණයෙන් චීන භාෂාවෙහි කාර්යයමය ස්වරූපය ඉතා සියුම් ව නිරීක්ෂණය කෙරෙයි.

**පර්යේෂණ සීමා**

චීන භාෂාවෙහි අතින්ද්‍රීය භාෂා ලක්ෂණ පිළිබඳ පමණක් විග්‍රහ කිරීමට පර්යේෂණය සීමා කෙරෙයි. ඊට අයත් මූලික කරුණු කෙරෙහි පමණක් අවධානය යොමු කෙරෙයි. ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස සම්මත චීන භාෂාව භාවිත කෙරෙයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදු කරන ලද මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය ගුණාත්මක පර්යේෂණ (qualitative research) ක්‍රමවේදය යටතේ සිදු වේ. එහි දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් දත්ත රැස්කරන ලදි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භාෂණ සංවාද ඇතුළත් පාඨ ග්‍රන්ථ, විෂය ප්‍රාමාණිකයින් සමඟ කරන ලද සාකච්ඡා සහ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මෙම මාතෘකාව හා බැඳි ශාස්ත්‍රීය කෘති, ලිපි සහ අන්තර්ජාලය දත්ත රැස් කිරීමට උපයෝගී කර ගැනේ.

**සෛද්ධාන්තික රාමුව**

මෙම පර්යේෂණය ඓතිහාසික වාග්විද්‍යාව හා සම්බන්ධ වූවක් බැවින් භාෂා වර්ගීකරණ පිළිබඳ ඓතිහාසික වාග්විද්‍යාත්මක අධ්‍යයන, සෛද්ධාන්තික රාමුව වශයෙන් යොදා ගැනේ.

**සාකච්ඡාව**

**භාෂා වර්ගීකරණය**

භාෂා වර්ගීකරණය සඳහා විවිධ නිර්ණායක භාවිත කෙරේ. ඓතිහාසික සම්බන්ධයට අනුව භාෂා වර්ග කිරීම, පද විචාරාත්මක නිර්ණායක, කාර්යයාත්මක මූලධර්ම, භාෂා රීති වැනි කරුණු ඒ අතර වේ.

**ඓතිහාසික සම්බන්ධයට අනුව භාෂා වර්ග කිරීම**

භාෂාවන් වර්ගීකරණය කිරීමේ තවත් ආකාරයක් වන්නේ ජාන සම්බන්ධතායි. භාෂා පවුල් සංකල්පය ජාන සම්බන්ධතාව මත ඉදිරිපත් කෙරිණි. ඓතිහාසික සම්බන්ධයට, වාක්‍ය නිර්මාණයට හා පද සිද්ධියට අදාළ ව විද්‍යානුකූල පරීක්ෂණයන්ට භාජනය කළ භාෂා පවුල්වලට හා පන්තිවලට බෙදා දක්වේ. ලෝකයේ පවතින සෑම භාෂාවක් ම භාෂා පවුල් පහකට අයත් වේ. ඒවා අතරින් චීන භාෂාව චීන තිබ්බතීය භාෂා පවුලට අයත් වේ.

i. ඉන්දු යුරෝපීය

ii. හැමිටෝ සෙමිටික්

iii. චීන තිබ්බතීය

iv. මලයෝ පොලිහීසියානු

v. ද්‍රාවිඩ

"පිළිගත හැකි පැහැදිලි සාක්ෂි මගින් බෙදීම නිරවුල් කළ හැකි හෙයින් මෙම ක්‍රමය අන් හැම ක්‍රමයකටම වඩා ශාස්ත්‍රීය වේ." (**ජයසේකර සහ ජයසේකර, 2000:140**).

**වාක්‍ය නිර්මාණය, පද සිද්ධිය අනුව භාෂා වර්ග කිරීම**

මෙය භාෂාවන්ගේ බාහිර ලක්ෂණ පමණක් බලා කෙරෙන වර්ග කිරීමකි. වාක්‍ය නිර්මාණය හා පද සිද්ධියට අදාළ කරුණු මෙහි දී සැලකිල්ලට ගැනේ.

හැම භාෂාවක ම අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රධාන අංගය වාක්‍යයයි. එම නිසා වාක්‍යය භාෂාවේ ඒකකය වශයෙන් සලකනු ලැබේ. ඉතා පහත් නො දියුණු භාෂාවල පවා වාක්‍ය නිර්මාණය කිරීමේ ක්‍රම තිබේ. එහෙයින් වාක්‍ය නිර්මාණය කිරීමේ විශේෂ ලක්ෂණ අනුව ලෝකයේ දියුණු නො දියුණු හැම භාෂාවක්ම වර්ග කළ හැකිය. මෙම ක්‍රමය අංග සම්පූර්ණ එකක් බැව් බොහෝ දෙන සලකන්නේ එහෙයිනි.

බාහිර ලක්ෂණයන්ගෙන් විනා වෙන කිසි ම ක්‍රමයකින් එකිනෙකට සම්බන්ධතාවක් නැති භාෂා රාශියක් එක් ගණයකට ඇතුළත් වන හෙයින් මෙම වර්ග කිරීම ශාස්ත්‍රීය නො වේය යනු නූතන විද්‍යාඥයන් වැඩි දෙනකුගේ මතය යි. (**ජයසේකර සහ ජයසේකර, 2000:140**).

I. Isolative Languages

II. Agglutinative Languages;

III. Fusional Languages;

IV. Polysynthetic Languages

චීන භාෂාව Isolating භාෂාවක් ලෙස හඳුනා ගැනීමට පහසු වන අතර සර්ගීකරණය හෙවත් ප්‍රත්‍යවත් කිරීමේ දී number සහ tenses වැනි කොටස් වෙන ම වචනයකින් ප්‍රකාශ කිරීම එයට හේතුව යි. භාෂාවන් වර්ග කිරීමේ දෙවන ක්‍රමයක් ලෙස ඒවාහි වාක්‍ය සංස්ථිතිවල පිළිවෙළ පදනම් කර ගත් (Word order) ක්‍රමය හඳුනා ගත හැකි ය.

I. SOV (Subject – Object- Verb)

වැඩිම භාෂා ගණනක් මේ කොටසට අයත් වේ. ඉන්දු යුරෝපීය භාෂා, ආර්මේනියානු, හංගේරියානු, තුර්කි සහ ඊට සම්බන්ධ භාෂා, කොරියානු, ජපන්, බුරුම, බාස්ක් සහ බොහෝ ඕස්ට්‍රේලියානු ආදි වාසී භාෂා, යනාදිය ඒ අතර වේ.

II. SVO (Subject – Verb - Object)

SVO යනු දෙවන විශාලතම කාණ්ඩයයි, නමුත් විශාල ප්‍රමාණයක භාෂකයින් පිරිසක් මෙම කාණ්ඩයට අයත් වේ. ඒවා ඡරුචදිසඑසදබි භාවිත කරන භාෂා සහ postpositions භාවිත කරන භාෂා ලෙස බෙදී යයි.

III. VSO (Verb - Subject –- Object)

"Next, we have the VSO (Verb - Subject –- Object)

languages. In Irish, they say Cheannaich mi blobhsa -- "Bought I blouse"—for I bought a blouse'x1

[මීලඟට, අපිට භාෂාවන් විස්තර කිරීමට තිබේ. අයිරිෂ් භාෂාවෙහිදී, ඔවුහු I bought a blouse යන ඉංග්‍රීසි වාක්‍ය සඳහා Cheannaich mi blobhsa යනුවෙන් පවසති. එහි පද පිළිවෙළ "Bought I blouse" ලෙස සටහන් වේ. ඒ අනුව අයිරිෂ් භාෂාව මෙම වර්ගයට අයත් වේ.]

මීට අමතර ව, VOS, OSV, OVS යන භාෂා වර්ග කිරීම් පවතින අතර චීන භාෂාව SVO භාෂාවක් ලෙස වර්ග කළ හැකි ය.

1. 我去城市。(wǒ qù chéngshì.) - මම නගරයට යමි.

| | | |
|---|---|---|
| 我 | 去 | 城市 |
| S | V | O |

SVO NdIdj, Prepositions ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

**කාර්යයාත්මක මූලධර්ම අනුව භාෂා වර්ග කිරීම**

ඉහත දක්වන ලද ප්‍රභේද සියල්ල තවත් තැනක කාර්යයාත්මක මූලධර්ම අනුව කොටස් දෙකකට සාකච්ඡා කරනු ලැබේ.

1. ඓන්ද්‍රිය භාෂා (Organic Languages)

2. අනින්ද්‍රිය භාෂා (Non-Organic Languages)

**ඓන්ද්‍රිය භාෂා**

අන්තර්යෝගී භාෂා (Incorporating Languages), සංශ්ලිෂ්ට භාෂා (Agglutinating Languages), සවිභක්තික හෙවත් වරනැගෙන භාෂා (Inflecting Languages) යනාදි භාෂා වර්ග මේ කොටසට අයත් වේ.

මූලික ව්‍යාකරණයක් ඇති සියලු ම භාෂා මෙම ගණයට අයත් වෙයි. එවැනි භාෂාවල වාක්‍ය නිර්මාණයේ දී ව්‍යාකරණ නීති රීති අනුගමනය කරනු ලැබේ. වාක්‍යයක ඇති පදාන්තර සම්බන්ධතාව දක්වන්නේ පද සිද්ධියේ හා නිපාත, උපසර්ග ආදියේ පිහිටෙනි. එම නිසා නාම, ක්‍රියා, නාම විශේෂණ, ක්‍රියා විශේෂණ ආදිය වාක්‍යයේ කොතැනක යෙදුවත් ඒවායේ තත්වය වෙනස් නොවේ. (**ජයසේකර සහ ජයසේකර, 2000ඃ 140**).

**අනින්ද්‍රිය භාෂා**

මේ ගණයට අයත් වන ප්‍රමුඛ භාෂාවක් ලෙස චීන භාෂාව හඳුනා ගත හැකිය. මේ කාණ්ඩයෙහි භාෂාවලට අනන්‍ය ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකි ය. මෙම භාෂාවල විශේෂ රීති මගින් ව්‍යාකරණය සකස් වනු දැක ගත හැකි ය.

මේ භාෂාවල මූලික ව්‍යාකරණයක් නැත. එහෙයින් නාම, ක්‍රියා, නිපාතාදි පද භේදයක් හෝ ප්‍රකෘති ප්‍රත්‍ය එක්වීමෙන් පද සිද්ධියක් හෝ නාම ක්‍රියා වරනැගීමක් හෝ නැත. භාෂාවේ සියලු ම වචන ප්‍රකෘති ශබ්ද වශයෙන් පවතී. කිසි විටක විකෘති බවට නො පැමිණේ. අප භාෂාවේ ඇති අව්‍ය පද මෙන් තනිව සිටී. එක ම වචනය වාක්‍යයේ යෙදෙන ස්ථානයට අනුව නාමයක්, ක්‍රියාවක්, විශේෂණයක් හෝ වෙන යම්කිසි පදයක් විය හැකිය. වාක්‍යයේ පද පිළිවෙළ යන්තම්වත් වෙනස් කළ හොත් එහි අදහස සම්පූර්ණයෙන් වෙනස් වේ. එම නිසා එම භාෂාවල වාක්‍ය නිර්මාණය ඉහත සඳහන් කළ ඓන්ද්‍රිය භාෂාවල වාක්‍ය නිර්මාණයට හාත්පසින් ම වෙනස් ය. (**ජයසේකර සහ ජයසේකර, 2000**ඃ 147).

අනින්ද්‍රිය භාෂාවක විද්‍යමාන ප්‍රධාන ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකිය.

I. එක වචනයකින් අදහස් කිහිපයක් දීම

II. එක ම වචනය තාල කීපයකට අනුව ශබ්ද කිරීමෙන් අමුතු වචන සාදා ගැනීම

III. එක ම වචනය වාක්‍යයේ යෙදෙන ස්ථානයට අනුව තත්වයෙන් වෙනස් වීම

IV. අදහස් පැහැදිලි කිරීම සඳහා යුගල පද යෙදීම

V. එක වචනයක් හැඳින්වීමට එක සංකේතය බැගින් ඇති විශේෂ ලිවීමේ ක්‍රමයක් භාවිත කිරීම **(ජයසේකර සහ ජයසේකර, 2000: 147).**

**චීන භාෂාව අනින්ද්‍රීය භාෂාවක් ලෙස**

**I. එක වචනයකින් අදහස් කිහිපයක් දීම**

"චීන භාෂාවේ පද ලිඛිත ව නිරූපණය කිරීමට යොදනුයේ චීන සංකේත අක්ෂර (Chinese Pictographs) ය. චීන සංකේත අක්ෂරවල දක්නට ලැබෙන එක් විශේෂත්වයක් නම් ඒවා නොවෙනස් ව වාක්‍යවල යෙදීම ය. චීන භාෂාවේ පද වරනැඟෙන්නේ නැති නිසා සංකේත අක්ෂර ද මෙසේ නොවෙනස් ව පවතී. එහෙත් අක්ෂර අනුසාරයෙන් එන පදවල තේරුම් වටහා ගැනීමේ දී ඒ අක්ෂර එක ම රූපයකුත් තිබුණ ද තේරුම් වෙනස් වන බව සඳහන් කළ යුතු ය."**(ප්‍රනාන්දු, 2018: සං).**

එක ම වචනයට බොහෝ අර්ථ තිබීම, චීන භාෂාව සම්බන්ධව වඩාත් සංකීර්ණ ලක්ෂණයක් ලෙස මෙම නිර්ණායකය පුළුල් ව විග්‍රහ කළ හැකි ය. එක ම රූප සංකේතය සහිත වචනයට ශබ්ද කිහිපයක් සහ අර්ථ කිහිපයක් තිබීම, එක ම ශබ්දයට අක්ෂර කිහිපයක් සහ අර්ථ කිහිපයක් තිබීම යනාදිය මෙයට ඇතුළත් විය යුතු ය.

**a. එකම වචනයට බොහෝ අර්ථ තිබීම**

මෙහි දී බොහෝ අර්ථ මෙන් ම සමානව ගැළපෙන අර්ථ ද දැකිය හැකි ය. 学:xu5) – පාසල සහ ඉගෙන ගන්නවා (නාම පාද, ක්‍රියා පාද සකස්කර ගැනීමේ දී සර්ගයක් ලෙස මෙම අක්ෂරය යොදා ගැනේ.) නාම පද සඳහා පාසල යන අර්ථයත් ක්‍රියා පද සඳහා ඉගෙන ගන්නවා යන අර්ථයත් මෙම පදය මගින් ප්‍රකාශ කෙරෙයි.

**නාම පද**

a. 大学 (dà xué ) - විශ්වවිද්‍යාලය

b. 学校 (xué xiào) - පාසල

**ක්‍රියා පද**

a. 开学 (kāi xué) - පාසල ආරම්භ කරයි.

b. 学习 (xué xí) - ඉගෙන ගනියි.

花(huā) – මෙම පදය වැය කරනවා, මල, විකසිත වෙනවා යන අර්ථවල, නාම පද සහ ක්‍රියා පද සකස්කර ගැනීමේ දී සර්ගයක් ලෙස යොදා ගැනේ.

**නාම පද**

a. 花儿 (huāér) - මල

**ක්‍රියා පද**

a. 开花(kāi huā) – මල විකසිත වෙයි

b. 花钱(huā qián) – මුදල් වියදම් කරයි.

**b. එකම රූප සංකේතය සහිත වචනයට ශබ්ද කිහිපයක් සහ අර්ථ කිහිපයක් තිබීම**

චීන භාෂාවේ ශබ්ද සංකීර්ණතාව පිණිස හේතු වන ප්‍රධාන කරුණක් ලෙස ඇතැම් අක්ෂරවලට පවතින බහු උච්චාරණ විධි පෙන්වා දිය හැකි ය. එබඳු අක්ෂරවලට චීන බසෙහි ‘多音字’ (duō yīnzì) යයි කියනු ලබයි. එහි සරල අදහස නම් ‘多’ (duō ) - ගොඩක්, ‘音’ (yīn)- ශබ්ද”字’ (zì) - අකුර හෝ අකුරු යන අරුත් කැටිකොට බොහෝ ශබ්ද සහිත අකුරු යන අදහස යි. මෙහි දී ශබ්ද කිහිපයක් යන්නට එක ම ශබ්දයේ තාන වෙනස්වීම් ද ඇතුළත් ය.

සමහර චීන රූපාක්ෂර එක් ආකාරයකට වඩා වැඩියෙන් උච්චාරණය කළ හැක. උදාහරණයකට '行' සමහරවිට xíng ලෙස කිය විය හැකි අතර ^自行车 වැනි) තවත් සමහර තැනක háng ලෙස කිය විය හැක (银行 වගේ). මෙවැනි ආකාරයේ අක්ෂර හඳුන්වන්නේ බහු උච්චාරණ අක්ෂර ලෙසයි. ඒ නිසා අප එය උච්චාරණය කිරීමට පෙර එම වචනයෙන් නියෝජනය වන්නේ කුමන අක්ෂරය දැයි දැන ගත යුතු ය. (中伟"(ed.), 2010: 98).

a. 谁(shéi)- කවු ද, 谁(shuí)- කවු ද (ගෞරවාර්ථයෙහි)

b. 没(méi)- නැත, 没(ක්‍රි.) (mò)- 没收(mò shōu) - රාජසන්තක කරනවා

c. 喂 (ක්‍රි.) (wèi)- හෙලෝ, (විශ්මයාර්ථය දනවන පදයකි.) යමෙකුට සංග්‍රහ කරනවා, 喂 (wéi) -

d. හෙලෝ 喂 (එන අමතුමක් ගැනීමේ දී)

e. 校(නා.) (xiào)- 学校(xuéxiào) - පාසල, 校(ක්‍රි.) :jiào)- 校验(jiào yàn)- පරික්ෂා කරනවා

f. 车(නා.) (chē)- රථය车(නා.), (jū)-(චීන චෙස් හා සම්බන්ධ වචනයකි.)

g. 分(ක්‍රි.) (fēn)- බෙදනවා, කොටස් කරනවා, චීනයෙහි මුදල් ඒකකයක් ද වේ.分(නා.) (fèn)-

h. කොටස, අවයවය, කෙනෙකුගේ යුතුකම් සහ වගකීම්වල ප්‍රමාණය, මිනිත්තුව

i. 米(නා.) (mǐ)- බත්ල米(නා.) (mí)- උණ බටය, බටය

j. 子(zi)- සමහර නාම පදවල පදාණුවක් ලෙස භාවිත වේ., 子(නා.) (zǐ)- දරුවා, පුතා

k. 见(ක්‍රි.) (jiàn)- දකිනවා, 见(ක්‍රි.) (xiàn)- පෙන්වනවා

l. 系(නා.) (xì)- ක්‍රමයලඅංශය, 系(ක්‍රි.) (jì)- ටයි එක බඳිනවා

m. 看(ක්‍රි.) (kàn)- බලනවා, 看(ක්‍රි.) (kān)- රැකබලා ගන්නවා

n. 说(ක්‍රි.) (shuō)- කියනවා, කතා කරනවා, 说(ක්‍රි.) (shuì)- ඒත්තු ගන්වනවා, 说(ක්‍රි.) (yuè)-

o. සතුටු වෙනවා

p. 喝(ක්‍රි.) (hē)- බොනවා, 喝(ක්‍රි.) (hè)- බෙරිහන් දෙනවා

q. 打(ක්‍රි.) (dǎ)- ගසනවා, අනිනවා, අල්ලනවා , 打(ග.) (dá)- දුසිම, දොළස

r. 雨(නා.) (yǔ)-වැස්ස, 雨(ක්‍රි.) (yù)- වැටෙනවා (වැස්ස, හිම වැනි දේ)

s. 识(නා./ක්‍රි.) (shí)- දැනුම, දැනගන්නවා, 识(නා./ක්‍රි.) (zhì)- මතක් කරනවා

t. 少(ක්‍රි./නා.වි.) (shǎo)- අඩු, නැති වෙනවා, 少(නා.) (shào)- බාලයා

u. 兴(ක්‍රි.) (xīng)- දියුණු වෙනවා, නැගෙනවා, 兴(නා.) (xìng)- සැලකිල්ල, ඇල්ම

C. **එකම ශබ්දයට අක්ෂර කිහිපයක් සහ අර්ථ කිහිපයක් තිබීම**

චීන භාෂාව තානක භාෂාවකි (Tonal Language). ශබ්ද සංකීර්ණතාව මෙහි ඇති ප්‍රධාන ලක්ෂණයකි. එක ම ශබ්දයට අක්ෂර කිහිපයක් සහ අර්ථ කිහිපයක් තිබෙන අක්ෂර විශේෂයක් ද චීන භාෂාවෙහි හමු වේ. මෙවැනි අකුරු බොහෝ ප්‍රමාණයක් චීන භාෂාවෙහි හඳුනා ගත හැකි ය. 'එක ම ශබ්දය' යන මැයෙන් තාන වශයෙන් එක ම තානයේ වරනැඟීමක් අපේක්ෂිත ය.

"**de**" (තානයක් රහිත)

**a.** "的" (bái bù de)- නිපාතයකි

**b.** "地" (tǔ bù de) - නිපාතයකි

**c.** "得" (chì bù de) - නිපාතයකි

"**tā**"

**a.** "她" (tā) - ඇය

**b.** "他" (tā) - ඔහු

**c.** "它" (tā) - එය

ii. **එක ම වචනය තාල කීපයකට අනුව ශබ්ද කිරීමෙන් අමුතු වචන සාදා ගැනීම**

චීන භාෂාව වැනි භාෂාවල ධ්වනිය උපයෝගී කර ගෙන ප්‍රභින්නත්වය ප්‍රකට කරයි. එක ම ශබ්දයේ උච්චාරණ කිහිපයක් දැක ගත හැකි ය. පදවල සෑම ශබ්දාදි හා ශබ්දාන්ත සංයෝගයකම පාහේ තාන එකක් හෝ කීපයක් තිබෙන අතර ඒ අනුව පදවල තේරුම් වෙනස් වේ. චීන භාෂාවේ තාන පහකි. ඒවා නම්,

1. පළමුවෙනි තානය (First tone)

妈(mā) - මව, අම්මා

2. දෙවෙනි තානය (Second tone)

麻(má) - හණ

3. තුන්වෙනි තානය (Third tone)

马(mǎ) - අශ්වයා


4. හතරවෙනි තානය (Fourth tone)

骂(mà) - බනිනවා


5. මධ්‍යස්ථ තානය (Neutral tone)

吗(ma) - (ප්‍රශ්නවාචක නිපාතයකි)

මෙම තාන උච්චාරණය වන ආකාරය පැහැදිලි කෙරෙන රූප සටහනක් පහත දක්වේ.




තාන උච්චාරණය කරන ආකාරය ප්‍රායෝගික මග පෙන්වීමකට අනුව ඉගෙන ගත යුතු ය. තානයක් හැඟවීම පිණිස සංකේත හතරක් භාවිත කරනු ලබන අතර ඒවා a, o, e, i, u, සහ ii යන අකුරුවලට උඩින් යොදනු ලැබේ. මෙබඳු අකුරු දෙකක් එක ළඟ යෙදී ඇති විට සංකේත යොදනු ලබන්නේ දෙවෙනි අකුරට උඩිනි. මධ්‍යස්ථ තානය සාමාන්‍ය පරිදි උච්චාරණය වන හෙයින් ඒ සඳහා සංකේතයක් නො යෙදේ.




එක ම ශබ්දය ක්‍රම පහකට ශබ්ද කළ හැකි වුවත්, ශබ්ද වන ආකාරය ලිවිය හැක්කේ එක ක්‍රමයකටය. විවිධ ශබ්ද හැඟවීම පිණිස

ශබ්දයට ඉහළින් වෙනස් ලකුණු භාවිත කෙරේ. මධ්‍යස්ථ තානයට ලකුණක් යොදන්නේ නැත. එමෙන් ම සෑම ශබ්දයක්ම තාන පසෙහි ම භාවිත වනවා යයි නියමයක් නැත. සමහර තානයක් මග හැරී යා හැකි ය.

**iii. එක ම වචනය වාක්‍යයේ යෙදෙන ස්ථානයට අනුව තත්වයෙන් වෙනස් වීම**

චීන භාෂාවෙහි නාමපද උක්ත අනුක්ත, වචන, ලිංග යනාදි භේදයන්ගෙන් තොරව, එක ම ස්වරූපයකින් භාෂාවෙහි භාවිත වේ. ඒවා වාක්‍යයෙහි යෙදෙන ස්ථානය සහ අවස්ථාව අනුව අදහස ඉදිරිපත් කෙරේ.

"එක ම වචනය වාක්‍යයෙහි යෙදෙන ස්ථානයට අනුව තත්වයෙන් වෙනස් වීම නිසා වාක්‍ය නිර්මාණයේ දී පද පිළිවෙළ ඉතා වැදගත් ස්ථානයක් ගනී. වාක්‍යයක පද පිළිවෙළ සුළු වශයෙන් හෝ වෙනස් කළ හොත් අදහස වෙනස් වේ. නාමයකට මුලින් යෙදෙන වචනය විශේෂණයක් වෙයි. ක්‍රියාව උක්තයටත් කර්මයටත් අතර යෙදේ."(**ජයසේකර සහ ජයසේකර**, 2000: 148).

a. 我帮助你。(wǒ bāngzhù nǐ.) - මම ඔබට උදවු කරමි.

b. 你帮助我。(nǐ bāngzhù wǒ.) - ඔබ මට උදවු කරහි.

iv. අදහස් පැහැදිලි කිරීම සඳහා යුගල පද යෙදීම

චීන භාෂාවෙන්高兴 (gāoxìng) යනු සතුටයි. එය භාවිතයේදී 高高兴兴 (gāogāoxìngxìng) යනුවෙන් ද යෙදේ. 妈 (mā) යනු මවයි. එය භාවිතයේදී 妈妈 (māma) යනුවෙන් යෙදේ. පහතින් දැක්වෙන ව්‍යවහාර ද එබඳු ව්‍යවහාර වේ. පවුලේ සාමාජිකයින්ගේ ඥාති නාම බොහෝදුරට මේ ක්‍රමයෙන් යෙදේ.

a. 爸爸 (bàba)- පියා

b. 哥哥 (gēge) - අයියා

c. 姐姐 (jiějie) - අක්කා

d. 妹妹 (mèiei) - නංගී

e. 谢谢 ස්තුතියි

අදහස් පැහැදිලි කිරීම සඳහා යුගල පද යෙදීම හා සමාස පද මෙන් වචන කීපයක් එකට කැටි කර ලිවීම බහුල වශයෙන් සිදු වේ. වැඩි වශයෙන් මෙය කෙරෙන්නේ කථා ව්‍යවහාරයේ ය. ශබ්ද කිරීමේ තාලයට අනුව එක ම වචනයෙන් වෙනස් අදහස් කීපයක් දෙන විට ශ්‍රවණේන්ද්‍රියේ සුළු දුර්වලකමක් පවා ඇති අයට අදහස් තේරුම් ගැනීම අපහසු වන හෙයින් යුගල පද යෙදීම අවශ්‍ය වී තිබේ. **(ජයසේකර සහ ජයසේකර, 2000: 148).**

**v. එක වචනයක් හැඳින්වීමට එක සංකේතය බැගින් ඇති විශේෂ ලිවීමේ ක්‍රමයක් භාවිත කිරීම**

අක්ෂර මූල දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතුවී සැදෙන චීන අක්ෂර සංකීර්ණ මුහුණුවරක් ගනියි. චීන අකුරු ලියන ආධුනිකයාට මූල ධාතු පිළිබඳ ව වන අවබෝධය භාෂාවේ දක්නට ලැබෙන ඕනෑම අකුරක පින්සල් පහර අනුපිළිවෙළින් ලිවීමේ පහසු ව ඇති කරයි. එවැනි අක්ෂර මූල දෙසිය දහහතරක් කන්ෂි නම් අධිරාජයා විසින් පිළියෙල කරන ලද ශබ්දකෝෂයේ පෙළගස්වා ඇත. ඒවා රූපමය සංඥාවන්ගේ එකතුවකි. භාෂාඥයින්ට අනුව චීන අකුරුවලින් සියයට හතරක පමණ ප්‍රමාණයක් අමිශ්‍ර රූපාක්ෂර වෙයි. සියයට අසූ දෙකක් පමණ අර්ථමය සහ ශබ්දමය වශයෙන් තැනුණු සංකීර්ණ අක්ෂර වේ. **(ගමගේ, 2008: 22).**

සෑම ආකාරයක ම චීන අකුරුවලට අක්ෂර මූල සංයුක්ත වී ඇත. තව ද භාෂාඥයන්ට අනුව චීන භාෂාවේ අක්ෂර වර්ග කොටස් කිහිපයකට සඳහන් කළ හැකිය.

1. රූපාක්ෂර

2. අර්ථාක්ෂර

3. සංයුක්ත රූපාක්ෂර සහ සංයුක්ත අර්ථාක්ෂර

4. අර්ථ ශබ්ද සංයුක්තාක්ෂර

5. ණයට ගත් අක්ෂර

චීන රූපාක්ෂරවල ඊට ම ආවේණික එහෙත් ස්වාභාවික සිද්ධි සහ වස්තු සමඟ සබැඳියාවක් දක්නට ලැබේ. ඇතැම් බහුල ව භාවිත කෙරෙන රූපාක්ෂර උපයෝගී කර ගෙන නව වචන නිර්මාණය කළ හැකි වීම චීන භාෂාවේ ස්වභාව යයි.

大(dà)〉

a. 大人(dàrén) - විශාල මිනිසා

b. 大国(dàguó) - විශාල රට

c. 大学(dàxué) - විශ්වවිද්‍යාලය

d. 大门(dàmén) - විශාල දොර

e. 大水(dàshuǐ) - විශාල ජල පහර

人(rén)〉

a. 好女人(hǎo nǚrén) - හොඳ ගැහැනිය

b. 好人(hǎo rén) - හොඳ මිනිසා

c. 小人(xiǎorén) - පොඩි මිනිසා

d. 大人(dàrén) - ලොකු මිනිසා

上(shàng) - උඩ , කලින්, පෙර 〉

a. 桌子上(zhuōzi shàng) - මේසය උඩ

b. 上个月(shàng gè yuè) - අවසන් මාසයේ, කලින් මාසයේ

c. 早上(zăo shang) - හිමිදිරිය

d. 晚上(wăn shang) - සවස

e. 上午(shàng wŭ) - පෙරභාගය, පෙරවරුව

f. 上课(shàng kè) - පන්තියට යනවා, පන්තිය ආරම්භ කරනවා

g. 上班(shàng bān) - වැඩ ආරම්භ කරනවා, වැඩට යනවා

h. 上来(shàng lái) - උඩට එනවා

i. 上去(shàng qù) - උඩට යනවා

下(xià) - යට, මීලඟ, පසු , පහළට 〉

a. 桌子下(zhuōzi xià) - මේසය යට

b. 下个月(xià gè yuè) - මීලඟ මාසයේ

c. 下午(xià wŭ) - අපරභාගය, පස්වරුව

d. 下课(xià kè) - පන්තියෙන් පිටව යනවා, පන්තිය අවසන් කරනවා

e. 下班(xià bān) - වැඩ අවසන් කරනවා, වැඩපලෙන් පිටව යනවා

f. 下来(xià lái) - පහළට එනවා

g. 下去(xià qù) - පහළට යනවා

එක අකුරක් හෝ වචනයක් හඳුනාගැනීම අකුරු හෝ වචන බොහෝ ප්‍රමාණයක් හඳුනාගැනීමට මඟ විවර කරයි. එක වචනයක් හැඳින්වීමට එක සංකේතය බැගින් යුතු සුවිශේෂී ලේඛන ක්‍රමය අනින්ද්‍රිය භාෂාවල ප්‍රධාන ලක්ෂණයකි.

## සමාලෝචනය

ගවේශිත කරුණු අනුව විද්‍යාත්මක මුහුණුවරකින් ඇරඹි භාෂා වර්ගීකරණය වාග්විද්‍යාවේ ආරම්භක අවධියෙහි වඩා අවධානයට ලක්වුණු කරුණක් ලෙස ප්‍රකට වෙයි. එම වර්ගීකරණයන් විවිධ මූලධර්මයන් මත පදනම්ව තහවුරු කෙරිණි. කාර්යයාත්මක මූලධර්මවලට අදාළ ව භාෂා වර්ග කිරීමේ දී, චීන භාෂාව අනින්ද්‍රිය භාෂාවක් ලෙස හඳුනා ගැනෙයි. චීන භාෂාවෙහි අනින්ද්‍රිය භාෂා ලක්ෂණ, විදේශ භාෂාවක් ලෙස චීන භාෂාව ඉගෙනීමේදී භාෂා උද්ග්‍රහණය පහසු කරන්නක් බව නිගමනය කළ හැකි ය. චීන භාෂාවෙහි ස්වභාවය හරිහැටි තේරුම් ගැනීම භාෂාව ගැඹුරින් හැදෑරීමට ද උපකාර කෙරෙයි. තව ද, චීන භාෂාවෙහි ව්‍යාකරණාත්මක ඥාණය තවත් පිරිසකට සම්ප්‍රේෂණය කිරීමේදී භාෂාවෙහි අනන්‍යතාවයන් හඳුනා ගැනීම චීන භාෂා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි අත්‍යාවශ්‍ය සාධකයක් බව අවධාරණය කෙරෙයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක, එස්, ඩබ්ලිව්.(2005). **භාෂා සමීක්ෂා.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

කරුණාතිලක, එස්, ඩබ්ලිව්.(1996). **වාග්විද්‍ය ප්‍රවේශය.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම. ගම්ලත්, සුචරිත () වාක්‍ය නිර්මාණ විධි.

නාගිත හිමි, කහරුගමුවේ., (සංස්.). (2000). **වාග්විද්‍යා 7.** කැලණිය: වාග්විද්‍යා අධ්‍යයනාංශය.

පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ (2016). **පර්යේෂන නිබන්ධ අත්පොත.** කොළඹ 10: ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ විමල්, ජී..(1995). **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

බලගල්ලේ විමල්, ජී..(2014). **භාෂී සන්නිවේදනය අර්ථවිචාරය හා උපයෝගිතා විචාරය.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

බලගල්ලේ විමල්, ජී..(2004). **සිංහල භාෂාධ්‍යයන ලිපි 1.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

බලගල්ලේ විමල්, ජී..(1992). **සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.** කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

බලගල්ලේ විමල්, ජී..(1998). **සිංහල භාෂාධ්‍යයන ඉතිහාසය**. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

රත්නපාල, නන්දසේන, (1995) **සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම**, වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ

රාජපක්ෂ, ආර්, එම්, ඩබ්,.(සංස්.). (2017). **කරුණා**. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

රාජපක්ෂ, ආර්, එම්, ඩබ්,'(සංස්.). (1992). **භාෂා විඥාන 2**. කොළඹ: සමයවර්ධන.

රාජපක්ෂ, ආර්, එම්, ඩබ්,.(2009) **වාග්විද්‍යා ප්‍රවේශය 2**. කැලණිය: වාග්විද්‍යා අධ්‍යයන අංශයග

රාජපක්ෂ, ආර්, එම්, ඩබ්,.(සංස්.). (1994). **වාග්විද්‍යා 8**. කැලණිය: වාග්විද්‍යා අධ්‍යයන අංශය.

රාජපක්ෂ, ආර්, එම්, ඩබ්,.(සංස්.). (1995). **සම්භාව්‍ය ශස්ත්‍රීය ලිපි සංග්‍රහය**. කැලණිය: සම්භාව්‍ය ප්‍රකාශන.

රාජපක්ෂ, ආර්, එම්, ඩබ්,, (සංස්.). (1995). **සම්භාව්‍ය ශස්ත්‍රීය ලිපි සංග්‍රහය 2**. කැලණිය: සම්භාව්‍ය ප්‍රකාශන.

රුවන්, G., (2008). අසිරිමත් **චීන බස**, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ10.

ලේකම්ගේ, දයාලාතා, (2006). **අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ**, කර්තෘ ප්‍රකාශන,

වික්‍රමසිංහ, එම්., (සංස්.). (1987). **වාග්විද්‍යා 3**. කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, එම්., (සංස්.). (1994). **වාග්විද්‍යා 5**. කැලණිය: වාග්විද්‍යා අධ්‍යයන අංශය.

වික්‍රමසිංහ, දයා, රාජපක්ෂ, ඩබ්ලිව්, විජේසේකර, සන්ධ්‍යා (සංස්.). (2009). **වාග්විද්‍යා ප්‍රවේශය 2**. කැලණිය: වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

විජේමාන්න, පියසීලී,.(2016). **භාෂා වීමංසා**. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම. විතාරණ, වි. (1984). පදය, වාක්‍යය සහ ඡේදය.

විමලානන්ද හිමි, ගල්කිරියාගම,.(සංස්.). (2003). **වාග්විද්‍යා 8**. කැලණිය: වාග්විද්‍යා අධ්‍යයන අංශය. සිරි ඤාණිස්සර හිමි, නිතලව () **ව්‍යාකරණ රත්නාකරය**

සුමනජෝති හිමි, පල්ලත්තර සහ පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ (1999). **වාග්විද්‍යාත්මක සිංහල ව්‍යාකරණය**. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

සුමනසාර හිමි, තිබ්බිරිවැව සහ තිලකසිරි, සිරි (1984). **සිංහල ව්‍යාකරණ**. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

Dhammadinna, N. (2016), **Our Chinese - Text book 1**. Bambalapitiya: Wijitha yapa Prakashana.

Pushpakumara, K.S. (2012). **The Impact of First Language on Second Language in Acquiring Prepositions**. M.A. Thesis in Linguistics, University of Kelaniya. (Not Printed)

Liu, X., (ed.). (2002). **New Practical Chinese Reader –Textbook 1**. Beijing: Beijing Language and Culture University Press.

Liu, X., (ed.). (2002). **New Practical Chinese Reader –Textbook 2**. Beijing: Beijing Language and Culture University Press.

Liu, X.(ed.), (2002). **New Practical Chinese Reader –Workbook 1**, Beijing Language and Culture University Press, Beijing.

Liu, X.(ed.), (2002). **New Practical Chinese Reader –Workbook 2**, Beijing Language and Culture University Press, Beijing.

寄州, 杨., (ed.). (2006). 汉语教程-第二册上. Beijing: Beijing Language and Culture University Press.

寄州, 杨., (ed.). (2006). 汉语教程-第二册下, Beijing: Beijing Language and Culture University Press.

婧，张., (ed.). (2008). 语法精讲精练. Beijing: Beijing Foreign Languages Printing House.

晓群, 俞., (ed.). (1979). 现代汉语八百词. 辽宁: 辽宁教育出版社.

兰萍, 曹., (ed.). (2008). 现代汉语词典第五版. 北京: 商花中书管.

中伟, 吴ගෑැග*ල (2010). නූතන චීන භාෂාව- පාඩම් පොත, බෙයිජිං විදේශ භාෂා මුද්‍රණාලය, බෙයිජිං.

中伟, 吴.(ed.), (2010). නූතන චීන භාෂාව-වැඩ පොත, බෙයිජිං විදේශ භාෂා මුද්‍රණාලය, බෙයිජිං.

中伟, 吴.(ed.), (2010). නූතන චීන භාෂාව-අක්ෂර පොත, බෙයිජිං විදේශ භාෂා මුද්‍රණාලය, බෙයිජිං.

玲″ 李慧 ˆed’ 《走遍义乌汉语300句》 (Live in yiwu 300 Mostuseful Chinese sentences). Wuhan: Wuhan University press.China.

晶疑, 徐. (2000). “中级汉语语法讲义” (Intermediate Chinese Grammar Course ). Peking university press.